ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2159/21 - 2020 ජනවාරි මස 22 වැනි බදාදා - 2020.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාවට අනුකූලව, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයට අදාළ වන රාජ්‍ය අමාත්‍යවරුන් වෙත වෙන්කර දෙනු ලබන විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. චන්ද්‍රසේන (පා.ම.)
පරිසර හා වනජීවී සම්පත් අමාත්‍ය

2020 ජනවාරි මස 17 වැනි දින,
"සොබාදම්පියස", අංක 416/1/සී,
රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල,
පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයේ දී

**උපලේඛනය**

**01. ගරු ජයන්ත සමරවීර, පරිසර රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. රටේ වන සනත්වය සුරක්ෂිත කරමින් දැව අවශ්‍යතාවය සපුරා ගැනීමේ වනෝත්පාදන හා වාණිජ වන වගා ප්‍රවර්ධනය කිරීම | 1. රාජ්‍ය දැව සංස්ථාව | • සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත (2008 අංක 35) |
| | 2. ලංකා ටිම්බර් ප්ලාන්ට් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් | • වෙරළ සංරක්ෂණ පනත (1981 අංක 57) |
| 2. සමුද්‍ර දූෂණය වැළැක්වීම | 3. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | |
| 3. වෙරළ සංරක්ෂණය හා වෙරළ සම්පත් කළමනාකරණය | 4. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | |

1A - G 31845 — 417 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**02. ගරු විමලවීර දිසානායක, වනජීවී සම්පත් රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. වනාන්තර, වන සතුන් හා තුරුලතා ආරක්ෂා කිරීම හා සංරක්ෂණය | 1. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | • 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥා පනත (451 වන අධිකාරය) |
| 2. වනජීවී සම්පත් සංරක්ෂණය | 2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | • ජාතික උරුම වනභූමි පනත (1988 අංක. 3) |
| 3. වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේ දී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. | 3. වනජීවී භාරය | • වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (1937 අංක. 2) |
| 4. වඳවියැමේ තර්ජනයට මුහුණපාන සත්ත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතිය හා ඊට අදාළ කටයුතු | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.